# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2160/28 - 2020 ජනවාරි මස 29 වැනි බදාදා - 2020.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016 (II)

### 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි (පා.ම.),**
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2020 අංක 1 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් තැනැත්තකු විසින් මෙහි උපලේඛනයෙහි I වන තීරුවෙහි නිශ්චිතව සඳහන් යම් වෛද්‍ය උපකරණ එකී උපලේඛනයේ II වන තීරුවේ අනුරූපී සටහන්වල නිශ්චිතව සඳහන් මිලට වඩා වැඩි මිලකට විකිණීම හෝ ඒ සඳහා අය කිරීම සිදු නොකළ යුතු ය.

(2) උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව සඳහන් මිල ගණන් එකී උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව සඳහන් වෛද්‍ය උපකරණ සඳහා උපරිම සිල්ලර මිල විය යුතු ය:

එසේ වුව ද, ජාත්‍යන්තර සැසඳුම් මිල ගණන් සහ වෙනත් සාධක අනුව උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණවල පවත්නා වෙළෙඳපල මිල උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු වන විට දී, එම වෛද්‍ය උපකරණ, කිසිදු මිල වැඩි කිරීමකින් තොරව, පවත්නා වෙළෙඳපොල මිලට විකුණනු ලැබිය යුතු ය.

3. ආනයනකරු හෝ නිෂ්පාදකයා විසින්, උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණවල වෙළෙඳ ඇසුරුම් හෝ ඒකකවල ලේබලය මත එම උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල මැකිය නොහැකි තීන්ත වර්ගයකින් පැහැදිලිව මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.


1A - PG 4851 — 617 (2020/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. 3 වන නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ නියෝග පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, ආනයනකරු හෝ නිෂ්පාදකයා විසින්, උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති පවත්නා වෛද්‍ය උපකරණ තොගයේ වෙළෙඳ ඇසුරුම් හෝ ඒකකවල ලේබලය මත උපරිම සිල්ලර මිල මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.

5. උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් විකුණනු ලබන හෝ එවැනි වෛද්‍ය උපකරණයක් සඳහා අය කිරීමක් කරනු ලබන යම් තැනැත්තකු විසින් වෙනම අයිතමයක් ලෙස එම වෛද්‍ය උපකරණයේ වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය, ඇසුරුමේ ප්‍රමාණය සහ මිල පැහැදිලිව පෙන්නුම් කරනු ලබන ලදුපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් විකුණනු ලබන හෝ එවැනි වෛද්‍ය උපකරණයක් සඳහා අය කිරීමක් කරනු ලබන සෑම තැනැත්තකු විසින්ම එම වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල එහි ආසන්නතම ඇසුරුමෙහි හෝ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

7. උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයට සමාන යම් වෛද්‍ය උපකරණයක වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සඳහා වන උපරිම සිල්ලර මිලක් එම උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති විට දී, එම වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල එම උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල විය යුත්තේ ය.

8. යම් වෛද්‍ය උපකරණයක වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති විට දී, එසේ නිශ්චිතව දක්වා නොමැති වෛද්‍ය උපකරණයේ වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සඳහා වන උපරිම සිල්ලර මිල 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද හඳුන්වා දීමේ මිල විය යුතු ය.

9. මෙම නියෝගයන්හි විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

10. මේ නියෝගයන්හි -

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට, (105 වන අධිකාරය) වූ වෛද්‍ය ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට, 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

## උපලේඛනය

(2 වන නියෝගය)

තෝරාගත් වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල

| *අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| | ***වෛද්‍ය උපකරණවල අනුමත නාමය*** | ***එක් ඒකකයක උපරිම සිල්ලර මිල (MRP) (ශ්‍රී ලාංකීය රුපියල්)*** |
| 1 | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | 15.00 |
| 2 | ඉවත දැමිය හැකි ශල්‍ය මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | 15.00 |
| 3 | මුහුණු ආවරණ (එන් 95 වර්ගය - අංශු ශ්වසන පෙරණය) | 150.00 |

02-237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.